## 2023 - 12 වන ශ්‍රේණිය
## තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය - I

08.05.2023

කාලය පැය 1 යි

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. තර්ක ශාස්ත්‍රය යනු සප්‍රමාණ චින්තනය පිලිබඳ දැනුම් සම්භාරයකි. යන නිර්වචනය ඉදිරිපත් කළේ,
   1) එල්.එස්. ස්ටේබින් 3) තේල්ස්
   2) ඇරිස්ටෝටල් 4) විට්ගන්ස්ටයින් 5) සුසාන් ස්ටේබින්

2. කාලය හා අවකාශය තුළ පවතින ඉන්ද්‍රිය ගෝචර වන වස්තූන් පිලිබඳ අදහස් වන පද වන්නේ,
   1) වාච්‍ය පද 2) වාචක පද 3) වියුක්ත පද 4) සංයුක්ත පද 5) සමානාය පද

3. ක්‍රි.පූ. 384-322 අතර කාලය තර්ක ශාස්ත්‍රයට වැදගත් වීමට හේතුව,
   1) චින්තන විප්ලවය ඇතිවූ යුගයයි.
   2) මධ්‍යතන යුගයයි.
   3) බෞද්ධ වස්තුකෝටිකය එළිදැක්වුණු යුගයයි
   4) ඇරිස්ටෝටල් ජීවත්වූ යුගයයි.
   5) සර් අයිසෙක් නිව්ටන් ගුරුත්වාකර්ෂණ වාදය ගොඩනැගූ කාලයයි.

4. 'අඳ', 'ගොළු', 'බීහිරි', යන පද,
   1) වියුක්ත පද වේ.
   2) සාපේක්ෂ පද වේ.
   3) නිරපේක්ෂ පද වේ.
   4) සාමූහික පද වේ.
   5) වෛකල්‍යවාචී පද වේ.

5. අර්ථය අතින් නොගැලපෙන වාක්‍ය මින් කුමක්ද?
   1) සියලු ක්‍රීඩකයින් දක්ෂය.
   2) ක්‍රීඩකයා දක්ෂය.
   3) කිසියම් ක්‍රීඩකයකු සිටිද ඔහු දක්ෂය.
   4) කිසිම ක්‍රීඩකයකු අදක්ෂ නොවේ.
   5) එක් ක්‍රීඩකයකු හැර අන් සියලු ක්‍රීඩකයින් දක්ෂය.

6. විශේෂ ප්‍රතිජානන ප්‍රස්තුතයක,
   1) වාච්‍ය සහ වාචකය යන පද දෙකම අව්‍යාප්ත වේ.
   2) වාච්‍ය සහ වාචකය යන පද දෙකම ව්‍යාප්ත ව යෙදේ.
   3) වාච්‍ය ව්‍යාප්ත වන අතර වාචකය අව්‍යාප්ත වේ.
   4) වාච්‍ය අව්‍යාප්ත වන අතර වාචකය ව්‍යාප්ත වේ.
   5) පද ව්‍යාප්තිය ගැන කිසිවක් කිව නොහැකිය.

7. "එක්කෝ මල් පියකරුය නැත්නම් මල් නොපියකරුය." යන ප්‍රකාශනය සත්‍ය වීමට අදාල වන්නේ,
   1) තදාත්ම නියමයයි.
   2) අවිසංවාදී නියමයයි.



Learning Resource Centre
R
De Mazenod College
Kandana

3) මධ්‍ය බහිෂ්කෘත නියමයයි.
4) ද්විත්ව නිශේධන නියමයයි.
5) පර්යාප්ත හේතු නියමයයි.

8. පහත දැක්වෙන පද යුගලයන්ගෙන් විසංවාදී යුගලය කුමක්ද?
1) ඉහල ,පහල 2) සුදු,කළු 3) සුදු,සුදු නොවන 4) උස්,මිටි 5) බාල,මහළු

9. විද්‍යාත්මක විප්ලවය ඇතිවුයේ,
1) එන්ගලන්තයෙහිය.
2) යුරෝපයෙහිය.
3) ප්‍රංශ විප්ල්වය සමඟය.
4) චීනයෙහිය.
5) ඇමරිකා එකසත් ජනපදයෙහිය.

10) "වැන්දඹුව තම ස්වාමියා සමඟ පොලට ගියාය" යන වාක්‍ය,
1) සත්‍යයකි.
2) සංශ්ලේෂී සත්‍යයකි.
3) අසත්‍ය වීමට සම්භාවිතාවයක් පවතී.
4) විශ්ලේෂී අසත්‍යයකි.
5) සත්‍ය-අසත්‍යය තීරණය කල නොහැකිය.

11) අසමමිතික සම්බන්ධයක් ඇති ප්‍රකාශය මින් කුමක්ද?
1) A,Bට සමානය.
2) A,Bගෙන් වෙනස් වේ.
3) A,Bගේ ඥාතියෙකි.
4) Aට වඩා B විශාලය.
5) A,Bගේ සහෝදරයාය

12) වාක්‍ය හා ප්‍රස්තුක අතර පවතින වෙනසක් නොවන්නේ කුමක්ද?
1) වාක්‍යයට කාල භේදයක් ඇතත් ප්‍රස්තුතයට කාල භේදයක් නැත.
2) වාක්‍යයකට ප්‍රකාරාත්මක වෙනසක් නැතත් ප්‍රස්තුකයකට එවැන්නක් ඇත.
3) වාක්‍යයකට ව්‍යාකරණානුකූලව වීම අවශ්‍ය වුවත් ප්‍රස්තුකයක එසේ අවශ්‍යම නැත.
4) භාෂා විවිධත්වය අනුව වාක්‍ය වෙනස් වුවත් ප්‍රස්තුකය එසේ වෙනස් නොවේ.
5) වාක්‍යයක වචනාර්ථයට අමතරව සංකේතාත්මක අර්ථයක්ද තිබිය හැකි වුවත් ප්‍රස්තුකයක තිබිය හැක්කේ එක් අර්ථයකි.

13) ශාස්ත්‍රඥයකු,ශිල්පියෙකු මෙන්ම ඉංජිනේරුවකු වූ යුග පුරුෂයා වන්නේ,
1) කොපර්නිකස්
2) කෙප්ලර්
3) ප්‍රැන්සිස් බේකන්
4) ගැලිලියෝ ගැලීලි
5) ලියනාඩෝ ඩාවින්චි

14) "ඇගේ මව මගේ මවගේ දියණියයි" යන්න දෙනු ලැබුවිට ඇ කවුද? පහත දැක්වෙන පිළිතුරු අතරින් සාවද්‍ය පිළිතුර තෝරන්න.
1) ඇ මාගේ මවයි.
2) ඇ මාගේ ලේලියයි.
3) ඇ මාගේ දියණියයි.
4) ඇ මාගේ සොයුරියගේ දියණියයි.
5) ඇ මාගේ මවගේ මිණිපිරියයි.

08 . 05 . 2023 12 ශ්‍රේණිය .

15) ප්‍රස්තුතයක ගුණය තීරණය වන්නේ ................ මගිනි. හිස්තැනට සුදුසු වචනය වන්නේ,
1) ප්‍රමාණය 2) වාචකය 3) වාච්‍යය 4) ඇඳුම 5) සංවාක්‍යය

16) "සියලු ශ්‍රී ලාංකිකයෝ බොරු කියන බව ශ්‍රී ලාංකිකයෙකු වන ජයවර්ධන මහතා පවසයි." මෙය,
1) විශ්ලේෂී සත්‍ය වාක්‍යයකි.
2) විශ්ලේෂී අසත්‍ය වාක්‍යයකි.
3) සප්‍රමාණ තර්කයකි.
4) විරුද්ධාභාසයයි.
5) නිෂ්ප්‍රමාණ සංවාක්‍යයකි.

17) තර්ක ශාස්ත්‍රය යනු,
1) රූපික විද්‍යාවකි. 2) සමාජීය විද්‍යාවකි. 3) ප්‍රාමාණික විද්‍යාවකි.
4) ස්වභාවික විද්‍යාවකි. 5) ආනුභූතික විද්‍යාවකි.

18) ප්‍රතිජානන ප්‍රස්තුත ප්‍රතිශේධන ප්‍රස්තුත වලින් වෙනස් වන්නේ,
1) ප්‍රමාණය අනුවය.
2) ගුණය අනුවය.
3) ප්‍රමාණය සහ ගුණය අනුවය.
4) වාච්‍ය හා වාචකය අනුවය.
5) සිද්ධිවාචක බව අනුවය.

19)

A

| | |
|---|---|
| A | MP |
| E | SM |
| O | SP |

B

| | |
|---|---|
| A | PM |
| I | MS |
| O | SP |

C

| | |
|---|---|
| O | PM |
| I | SM |
| I | SP |

D

| | |
|---|---|
| E | MP |
| I | MS |
| O | SP |

A හි අයත්‍ා පක්ෂ පද ආභාසය ඇත.
1) සියල්ලම නිශ්ප්‍රමාණය.
2) D පමණක් සප්‍රමාණය.
3) C සහ D සප්‍රමාණය.
4) B සහ D සප්‍රමාණය.

20) පර්යාප්ත හේතු මූලධර්මය ඉදිරිපත් කරනු ලැබුවේ,
1) බර්ට්‍රන් රසල් ය
2) ඇරිස්ටෝටල්ය.
3) ප්ලේටෝ ය
4) සොක්‍රටීස් ය.
5) ලයිබ්නිට්ස් ය.

21) යාපනයට දකුණින් අනුරාධපුරය පිහිට ඇත. යන ප්‍රස්තුතය හැඳින්වීමට සුදුසු වර්ගය,
1) නිරුපාධික 2) සෝපාධික 3) වියෝජක 4) අණුක 5) නිරුපාධික නොවන

22) ජ්‍යෙෂ්ඨත්වය අනුව නිවැරදිව පෙළ ගස්වා ඇති වරණය කුමක්ද?
1) සොක්‍රටීස්, ඇරිස්ටෝටල්, ප්ලේටෝ, නිව්ටන්.
2) ප්ලේටෝ, සොක්‍රටීස්, ඇරිස්ටෝටල්, නිව්ටන්.



Learning Resource Centre
R
De Mazenod Coll...
Kan...

3) සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල්, නිව්ටන්.
4) සොක්‍රටීස්, ඇරිස්ටෝටල්, ප්ලේටෝ, නිව්ටන්.
5) සොක්‍රටීස්, ප්ලේටෝ, නිව්ටන්, ඇරිස්ටෝටල්.

23) නවීන විද්‍යාවේ ආරම්භයට වෙඩි බෙහෙත් මුද්‍රණ ශිල්පය , මාලිමා යන්ත්‍රය දායාද කර දෙනු ලැබූ රට කුමක් ද?

1) රුසියාව 2) ඉන්දියාව 3) චීනය 4) එංගලන්තය 5) ජපානය

24) පහත දැක්වෙන ඒවායින් අයතා පක්ෂ පද අභ්‍යාසය ඇතිවන ආකෘතිය කුමක් ද?

| 1) | 2) | 3) | 4) | 5) |
|---|---|---|---|---|
| A MP | A PM | A MP | I PM | A MP |
| I MS | E SM | A MS | O SM | A SM |
| A SP | E SP | I SP | O SP | A SP |

25) ව්‍යවහාරික භාෂාවේ සංදිග්දතාවය යනු,

1) අර්ථ ශුන්‍ය භාවය
2) අර්ථ ව්‍යාකූලතාවයක් ඇති බව
3) වැරදි අර්ථයක් ඇති බව
4) ඔප්පු කළ නොහැකි බව
5) ව්‍යාකරනාණුකූල නොවන බව

8.05.2023

# 2023 – 12 වන ශ්‍රේණිය

## තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය II

**(කාලය පැය 01)**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01) (අ) පහත දැක්වෙන ප්‍රස්තුත නිරුපාධික ස්වරූපයට හරවන්න.

i. සතුරෝ එකෙක් නැර පලා ගියහ.

ii. යමෙකු දාර්ශනිකයකු නම් ඔහු බුද්ධිමත්ය.

iii. එක් මලක් හැර අන් සියලු මල් සුවඳයි.

iv. ලොතරැයි පතක් මිලදී ගත අය පමණක් වාසනාවන්තය.

(ආ) තර්ක ශාස්ත්‍රය පිළිබඳ නිවචන 2ක් ලියන්න. (ල.10)

02) සටහන් ලියන්න. (2 ක් පිළිබඳව)

i. මධ්‍යතන යුගය.

ii. ශිල්පවේදය සහ ශාස්ත්‍රවේදය

iii. පදව්‍යාප්තය පිළිබඳ සංවාක්‍ය රීති (ල.10)

03) i. තර්ක ශාස්ත්‍රයේ උපයෝගිතාවන් විස්තර කරන්න.

ii. වස්තු අර්ථය සහ ගුණාර්ථය පහදන්න (ල.10)

04) පහත දැක්වෙන සංවාක්‍ය සප්‍රමාණ වේද, නිශ්ප්‍රමාණ වේද යන්න දක්වන්න. නිශ්ප්‍රමාණ වේ නම් බිඳී ඇති රීතිය/රීති හා සිදුවී ඇති ආභාසය/ආභාස ද නම් කරන්න.

i. සමහර මූර්ති ශිල්පීන් කලාකරුවන් වන හෙයින් හා කිසිම චිත්‍ර ශිල්පියකු, මූර්ති ශිල්පියෙකු නොවන හෙයින් සමහර කලාකරුවන් චිත්‍ර ශිල්පීන්ය.

ii. සියලු දාර්ශනිකයින් මිනිසුන්ය මෝඩයින් දාර්ශනිකයින් නොවේ. එබැවින් කිසිම මෝඩයකු මිනිසකු නොවේ.

iii. ළමයින් පමණක් විනෝදයට කැමතිය. එසේ වන්නේ සමහර ළමයින් දඟකාර නිසාත් දඟකාර අය විනෝදයට කැමති නිසාත්ය.

iv. සමහර මල් පියකරුය. ලස්සන මල් අපනයනය කරනු ලැබේ. එබැවින් සමහර අපනයනය කරනු ලබන දේ පියකරුය. (ල.10)

05) (අ) ඔබ කැමති විද්‍යාඥයකු පිළිබඳ සටහනක් ලියන්න. (ල.05)

(ආ) "විරුද්ධාභාසය" පැහැදිලි කරන්න. (ල.05)

Learning Resource Centre
R
De Mazenod College
Kandana